(1) 1) රෙදිපිළි අලංකරණයේදී භාවිතා කරන ක්‍රම 2 ක් ලියන්න.

2) අතීතයේ මුතුන් මිත්තන් සිතුවම් ඇඳීම හා නූල් වර්ණ ගැන්වීම සඳහා භාවිතා කළේ පාරිසරික සම්පත්ය. ඒ අතරින් වර්ණ සැකසීමට භාවිතා කළ අමුද්‍රව්‍ය 3 ක් නම් කරන්න.

3) අතීතයේ වර්ණ ලබා ගැනීමට යොදාගත් අමුද්‍රව්‍ය හා වර්ණ ගලපන්න.

ලබාගත් වර්ණය	යොදාගත් අමුද්‍රව්‍ය
1.සුදු වර්ණය	A ගොතටු ගසේ කිරි
2.කහ වර්ණය	B නිල් ඇවරිය ගසෙන්
3.නිල් වර්ණය	C අඳුන් දැලි ඇසුරෙන්
4.කළු වර්ණය	D මකුළු දැලි භාවිතයෙන්

(2) 1) රෙදිපිළි අලංකරණයේ දී හොඳින් සායම් උරාගැනීම හා සායම් ස්ථිර කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේද හඳුන්වන්නේ කුමන නමකින්ද?

2) නිෂ්පාදිත රෙදිපිළි වර්ණ ගැන්වීමට පෙර ඊට සූදානම් කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාවලි 3ක් නම් කරන්න.

3) කැඳහරණය සිදු කරන්නේ කෙසේ ද? කෙටි විස්තරයක් ලියන්න.